06

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට ආවේණික ඉංග්‍රීසි වචන (Computer Jargon) සිංහල භාෂාවට හැරවීම සහ ඒවා කෙතරම් දුරට එදිනෙදා ව්‍යවහාරයේ භාවිත වේද? යන්න පිළිබඳ අධ්‍යයනයක්.

ඩී. තිළිණි ප්‍රදීනාන්දු

වර්තමානයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය බොහෝ දෙනෙකුගේ වැඩි අවධානයට යොමු වී ඇත්තේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විෂයට ප්‍රධාන විෂයක් ලෙස එය ඇතුලත් කිරීමත් සමගයි. ඒ සමගම මෙම විෂය ක්ෂේත්‍රයට ආවේණික වචන (Computer Jargon) සිංහලට පරිවර්තනය කිරීම හෝ එම වචනවලට අනුරූප සිංහල වචන නිර්මාණය කිරීම සහ අවශ්‍ය පෙළපොත් , ගුරු අත්පොත් සිංහලෙන් රචනා කිරීමේ ගැටලු පැන නැංගේය. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය (ICTA) , කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනාංශයේ භාෂා තාක්ෂණ පරීක්ෂණාගාරය වැනි ආයතනවල දායකත්වයෙන් බොහොමයක් වචන දැනටමත් සිංහලට හරවා ඇති අතර පෙළපොත් සහ ගුරු අත්පොත් ද සිංහල සහ ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන්ම රචනා වී ඇත. මහත් පරිශ්‍රමයක් යොදා මෙම ඉංග්‍රීසි වචන සිංහලට පරිවර්තනය කළ ද ප්‍රායෝගිකව බලන කල්හි, එදිනෙදා ව්‍යවහාරයේ දී මෙම සිංහල වචන භාවිත වන්නේ ඉතා අල්ප වශයෙනි. බොහෝ විට භාවිත වන්නේ ඊට අදාළ ඉංග්‍රීසි වචනයයි. එම නිසා මෙම සිංහල වචන සමාජගත කිරීම සම්බන්ධයෙන් ගැටලුවක් පවතී. තවද මෙම වචන කෙතරම් දුරට එදිනෙදා ව්‍යවහාරයේ යෙදෙන ස්වභාවික බස තුළ යොදා ගත හැකිද යන ගැටලුව ද පවතී. මෙයට හේතු වී ඇත්තේ වචනය ඇසූ සැනින් එහි තේරුම මව් භාෂිකයෙකුට නිරායාසයෙන්ම අවබෝධවන තත්ත්වයේ නොතිබීමයි. උදාහරණ වශයෙන් Download - අවපතනය කරනවා ,Install - පිහිටුවනවා , Logoff - වරන්න , Cancel වැරුම , Logon - පුරන්න යන වචන දැක්විය හැකිය. ඒ අනුව මෙම වචනවලට කෙතරම් සාර්ථකව එදිනෙදා ව්‍යවහාරයේ භාවිත වන ස්වභාවික භාෂාව සමග සම්බන්ධ විය හැකිද යන ගැටලුව ද පවතින බව පසක් වේ. මෙම අධ්‍යයනයේ දී

ඉහත ගැටලු පිළිබඳව අධ්‍යයනය යොමු කරමින් ඒවාට පිළියම් සෙවීමට අදහස් කෙරේ. මෙම වචන මේ දක්වා කෙතරම් දුරට සමාජගත වී තිබේද යන කරුණ සම්බන්ධයෙන් තොරතුරු සෙවීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විෂය සඳහා උගන්වන ගුරුවරුන්ගෙන් ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදය අනුගමනය කෙරේ. තවද එසේ සිංහල වචන භාවිතයට නොගැනීමට පෙළඹෙන හේතු සහ ඒ සම්බන්ධයෙන් ඔවුන් තුළ ඇති නව අදහස් ද ප්‍රශ්නාවලිය මගින් විමසුමට ලක්කෙරෙන අතර ඒ තුළින් ස්වභාවික භාෂාවට මෙම වචන සම්බන්ධ කළ හැකි මාර්ගයක් හඳුනාගැනීමට ද මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වේ.

ප්‍රමුඛ පද :- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට ආවේණික වචන (Computer Jargon), ඉංග්‍රීසි භාෂාව , සිංහල භාෂාව , ස්වභාවික භාෂාව.

හැඳින්වීම

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස්පෙළ විභාගයේ විද්‍යා/ගණිත විෂය ධාරාවට ප්‍රධාන විෂයක් ලෙස ඇතුලත් කරනු ලැබුයේ 2009 වර්ෂයේ සිට ය. ඊට පෙර සිටම මෙම යෝජනාව ඉදිරිපත් වීමත් සමගම පැන නැගුනු එක් බරපතල ගැටලුවක් නම්, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය සඳහා විෂය නිර්දේශයක්, ගුරු අත්පොත් සහ පාරිභාෂික ශබ්ද මාලාවක් සිංහල බසින් සකස් කිරීමයි. තොරුතුරු තාක්ෂණ විෂය වර්තමානයේ මුළු ලෝකයේ ම බහුලව භාවිතා වන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි. නමුත් ස්වකීය මව්භාෂවෙන් ම මෙම විෂය ක්ෂේත්‍රයේ හිනිපෙත්තට ළඟා වූ රටවල් ද නැතුවා ම නොවේ. උදාහරණ ලෙස ජපානය, චීනය, කොරියාව, තායිලන්තය වැනි රටවල් දැක්විය හැක. නමුත් ලංකාවේ දක්නට ලැබෙන්නේ මෙයට වඩා හාත්පසින් ම වෙනස් තත්ත්වයකි. එනම්, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය සිංහල භාෂාවෙන් හැසිරවීමට වර්තමාන තරුණ පරම්පරාව උත්සහ නොකිරීමත් නිසා මෙම විෂය සිංහල බසින් ඉගෙන ගැනීමට හෝ හැසිරවීමට නොහැක යන ආකල්පය සමාජය තුළ ගොඩනැගී තිබීම ය. කෙසේ නමුඳු වර්තමානය වනවිට සිංහල බසින් විෂය නිර්දේශයක්, ගුරු අත්පොත්

සහ පාරිභාෂික ශබ්ද මාලා සම්පාදනය වී ඇත. නමුත් සිංහල භාෂාවෙන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය ඉගෙනීම, ඉගැන්වීම සහ එදිනෙදා ජීවිතයේ දී භාවිතයට ගැනීම කෙතරම් දුරට සාර්ථකව සිදු වේද සහ එය සිංහල භාෂාවෙන් භාවිතයට ගැනීම ප්‍රචලිත කිරීම සඳහා මහත් පරිශ්‍රමයක් දරා සම්පාදනය කළ ඉහත සඳහන් ග්‍රන්ථවලින් ලැබෙන දායකත්වය සාර්ථකත්වය සොයාබැලීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

පර්යේෂණ ගැටලුව

මෙම පර්යේෂණය සඳහා යොමු වීමට බලපෑ ප්‍රධාන ගැටලුව වූයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට අදාළ ලේඛණයක් පරිවර්තනය කිරීමේ දී හමුවන තාක්ෂණික වචන පරිවර්තනය කිරීමට ප්‍රමාණවත් තරම් මූලාශ්‍ර (පාරිභාෂික ග්‍රන්ථ මාලා) නොමැති වීමත් සහ නිවැරදි පාරිභාෂික වචන මහත් පරිශ්‍රමයක් දැරීමෙන් පසු සොයා ගත්ත ද එය පරිවර්තන ලේඛනයට අනුගතවන පරිදි යොදාගැනීමට නොහැකි වීමත් යන ගැටලු වලට පරිවර්තකයෙකු වශයෙන් මා හට මුහුණ පෑමට සිදු වීම ය. 2009 වර්ෂය වන විට සිංහල භාෂාවෙන් මෙම විෂයට අදාළ පාරිභාෂික ග්‍රන්ථමාලා, ඇතුළුව විෂය නිර්දේශයක් සහ ගුරු අත්පොත් රචනා වුව ද එම වර්ෂයේ සිට ම සිංහල මාධ්‍යයෙන් මෙම විෂය අ.පො.ස උසස් පෙළ විභාගයේ ප්‍රධාන විෂයක් ලෙස ලංකාවේ දරුදැරියන් හදාරමින් සිටිය ද, තවමත් මෙම විෂයට අදාළ සිංහල පාරිභාෂික වචන සමාජගත වී නොමැත. එමනිසා ඉහත සඳහන් කළ ගැටලු අතරින් පසුව සඳහන් කළ ගැටලුව වන, එනම් පරිවර්තන ලේඛනයට අනුගතවන පරිදි සිංහල පාරිභාෂික වචන යොදාගැනීමට නොහැකිවීමේ බරපතල ගැටලුව තවමත් විසඳී නොමැති බව අවබෝධ වේ.

සොයාගැනීම්

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභායට විද්‍යා/ගණිත විෂය ධාරාවෙන් හැදෑරිය හැකි ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළු කිරීමත් සමඟ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය සඳහා භාෂා සහ තාක්ෂණ විශේෂඥයන්ගේ මැදිහත් වීමෙන් සම්පාදනය වුණු උසස් තත්වයේ පාරිභාෂික ශබ්දමාලාවත් නොතිබීමේ අඩුපාඩුව මඟහැරුණි. තව ද

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය සිංහල භාෂාවෙන් භාවිතයට ගැනීම සඳහා ද මෙයින් ලැබෙන්නේ මහත් පිටිවහලකි. මෙම විෂය සඳහා ගුරු අත්පොත් යනාදිය සම්පාදනයේ දී විෂය පථය, විෂය අන්තර්ගතය යන කරුණු සම්බන්ධයෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ පීඨය, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනයේ විද්‍යා සහ තාක්ෂණ පීඨය, අධ්‍යපන අමාත්‍යාංශය, කැලණිය විශ්වවිද්‍යාලයේ සංඛ්‍යානය සහ පරිගණක විද්‍යා අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ගේට්වේ ජාත්‍යන්තර පාසල වැනි අයතන සම්බන්ධ වී ඇත. විශේෂයෙන් ම භාෂාව සහ සම්බන්ධ ගැටලු සඳහා ඉහත සඳහන් ආයතනවලට අමතරව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලයීය භාෂා තාක්ෂණ පර්යේෂණාගාරය වැනි ආයතන සම්බන්ධ වී ඇත.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය උසස්පෙළ විෂය ධාරාවට එකතු කිරීම ඉතා වැදගත් පියවරකි. පුද්ගලයන්ගේ දෛනික කටයුතු සහ ආයතනයන් හි කාර්ය සාධනය නිෂ්පාදනය කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව දියුණු කිරීම සඳහා භාවිත කල හැකි මෙවලමක් ලෙස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය මුලු ලොවම හඳුනාගෙන ඇත. එමනිසා ලාංකික තරුණ පරපුර තොරතුරු තාක්ෂණයෙන් සවිබල ගැන්වීම දියුණු වන රටකට අත්‍යාවශය වේ. එමෙන් ම තොරතුරු තාක්ෂණ විෂය සිංහල භාෂා මාධ්‍යයෙන් සවිබල ගැන්වීම සඳහා මෙමඟින් ලැබෙනුයේ අති විශාල පිටුවහලකි.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය සිංහල මාධ්‍යයෙන් භාවිතයට ගැනීමේ ඉතිහාසය දෙස බැලූ විට, ඒ සඳහා මුල් ම උත්සාහය ගෙන ඇත්තේ 1980 වර්ෂයේ දී DMS මෙට්‍රොපොලිටන් ආයතනය යි. සිංහල භාවිත මෘදුකාංග නිපදවමින් ඔවුන් මේ සඳහා මූලාරම්භය සැපයී ය. ඉන්පසු 1985 දී ශ්‍රී ලංකා පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාව (CINTEC) ආයතනය පිහිට වූ පසු සිංහල සහ දමිළ භාෂාවලින් පරිගණක භාවිත අවශ්‍යතා පිළිබඳව කටයුතු කිරීමට කමිටුවක් පිහිටුවීමට රජය විසින් පියවර ගන්නා ලදි. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය සඳහා ජාතික භාෂා යොදා ගැනීමේ

කමිටුව (Committee on Adaptation of National Language in IT - CANLIT) පිහිට වූයේ මෙයින් පසුව යි. 1997 - යුනිකෝඩ වැඩ කණ්ඩායම (Unicode Working Group) පිහිටු වීම තවත් වැදගත් පියවරකි. මෙම විෂය 1990 දශකයේ සිටම ලංකාවේ භාවිත වුව ද, ඒ සඳහා වන සිංහල පාරිභාෂික වචන නැතහොත් තාක්ෂණික වචන සාර්ථකව නිර්මාණය වීම ආරම්භ වූයේ ඉතා මෑත භාගයේ ය. මෙම ක්‍රියාවලිය 1980 වර්ෂයේ සිට ඉතා මන්දගාමීව සිදු වූ අතර 1997 දී ආරම්භ වූ යුනිකෝඩ වැඩ කණ්ඩායම විවිධ අඩුපාඩු සහිත යුනිකොඩ මෘදුකාංග හඳුන්වාදෙමින් අවසානයේ දී 2004 වර්ෂයේ දී සාර්ථක මෘදුකාංගයක් හඳුන්වාදීම, ඉෆියුෂන් ආයතනය කපුටා සිංහල අක්ෂර හඳුන්වාදීම, ඉෆියුෂන් සමාගමේ මූලිකත්වයෙන් 2006 වසරේදී සිංහල යුනිකෝඩ් හා අදාල කරුණු සාකච්ඡා කෙරෙන ගූගල් සිංහල යුනිකෝඩ් සමූහය ආරම්භ කිරීම
(https://groups.google.com/forum/m/#!forum/Sinhala-Unicode)
යනාදිය සුවිශේෂි සංධිස්ථාන ලෙස නම් කල හැකිය (උපග්‍රන්ථය - 01 බලන්න, පිටු අංක 11 සිට 16 දක්වා). තව ද 2009 වර්ෂයේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට ප්‍රධාන විෂයක් ලෙස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය හඳුන්වාදීම මේ සියල්ල අතරින් ප්‍රමුඛ වේ.

ඒ අනුව 1980 වර්ෂයේ සිට ම සිංහල වචන නිෂ්පාදනයවීමේ ක්‍රියාවලිය සිදුවුව ද එදිනෙදා ජීවිතයේ දී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය ක්ෂේත්‍රය තුළ ප්‍රායෝගිකව නියැලීමේ දී වුව ද එසේ නිර්මාණය වූ සිංහල වචන භාවිතා කිරීම සිදු නොවේ. බහුතරයක් පිරිස භාවිත කරනුයේ ඉංග්‍රීසි වචනයි. මෙයට හේතු ලෙස ප්‍රධාන කරුණු කිහිපයක් හඳුනාගත හැකි ය.

01. තොරතුරු තාක්ෂණ විෂය ලංකාව පුරා ව්‍යාප්තවීමේ ක්‍රියාවලිය මන්දගාමීව සිදුවීම සහ ඒ නිසාම සිංහල වචන නිෂ්පාදනය වීමේ ක්‍රියාවලිය ආරම්භ වීමට කල්ගත වීම සහ එය ද මන්දගාමීව සිදු වීම.

02. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට අදාළ ඉංග්‍රීසි තාක්ෂණික වචන එය මුල් කාලයේ සිටම ව්‍යාප්ත වූ භාෂක සමාජ තුළ ප්‍රබල ලෙස ව්‍යාප්ත වී තිබීම.

03. අනෙකුත් භාෂක සමාජ තුල ද සිංහල වචනයට පෙර ඉංග්‍රීසි වචනය සමාජගත වීම. එමනිසා භාෂකයා සිංහල වචනයට වඩා ඉංග්‍රීසි වචනයට සමීප වීම.

04. සිංහල පාරිභාෂික වචන ස්වභාවික සිංහල භාෂාව සමඟ අනුගත නොවීම නොහොත් එම වචනවල තේරුම් නිරායාසයෙන්ම (Self Explanatory) අවබෝධවන තත්වයේ නොතිබීම.

මෙහි සඳහන් පළමු කරුණ දෙස අවධානය යොමු කලවිට පරිගණක ආශ්‍රිත ඉගෙනුම (CAL), අ.පො.ස (ස/පෙ) සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය (ICT), 12 වන ශ්‍රේණිය සඳහා සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) වැනි වැඩසටහන් මඟින් නූතන ශ්‍රී ලංකීය ද්විතියික අධ්‍යාපන පද්ධති ප්‍රමාණවත් තරම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට නිරාවරණය වී තිබේ. තව ද පෙර සඳහන් කළ පරිදි මෙම විෂය උසස් පෙළට ප්‍රධාන විෂයක් ලෙස ඇතුලත් කිරීම මඟින් රාජ්‍ය අනුග්‍රහය ද ඇතිව, තෘතීයික අධ්‍යාපනය සඳහා ද මෙම විෂය ව්‍යාප්ත කිරීමට ගත් පියවර නිසා මන්දගාමීව හෝ වර්තමානය වනවිට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය ලංකාව පුරා සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත වෙමින් පවතී. නමුත් මෙම ක්‍රියාවලිය මන්දගාමීව සිදුවීම මෙම විෂය සිංහල මාධ්‍යයට හැරවීම සහ සිංහල මාධ්‍යයෙන් ඉගෙනගැනීම, ඉගැන්වීම සහ භාවිතා කිරීම සඳහා දැඩි ලෙස බලපා ඇත. යම් වචනයක් මව් භාෂාව නොවන මධ්‍යයකින් හෝ වේවා යම් භාෂක සමාජයක් තුළ දිර්ඝ කාලයක් පැවතීමෙන් ස්ථාපනය වු විට, එම වචනය ඉවත්කර ඒ වෙනුවට එම භාෂක සමාජයේ මව්භාෂාවෙන් පවා වචනයක් ස්ථාපනය කිරීම හෝ වීම දුෂ්කරය. එවැනි වෙනසක් කිරීමට නම්, අඩු තරමින් එම භාෂක සමාජයේ අති බහුතරයක් පිරිස එම වචනය පිලිගනිමින් පැරණි වචනය භාවිතයෙන් ඉවත් කිරීමටත් එකඟ විය යුතුය. මෙම එකඟවීම හුදෙක් කාලයක් සමඟ අලුත් වචනය භාවිතයට ගැනීම නිසා සිදුවන්නක් ම පමණක් වන අතර භාෂක සමාජයේ සියලු දෙනා එක්රැස් වී සම්මේලනයක් පවත්වා පොදු එකඟතාවයකට පැමිණිමෙන් සිදුවන්නක් නොවේ. එනම්, එම වචනය සමාජගත වීම සහ එම වචනයට නිශ්චිත තේරුමක් ස්ථාපනය වීම සිදු වන්නේ රූඪියක් මඟින් වන බවයි. මෙය දීර්ඝ කාලීනව භාෂක සමාජයේ අස්සක් මුල්ලක් නැර ක්‍රියාත්මක වීමෙන් පසු ඇතිවන ප්‍රතිඵලයකි. නමුත් ගෝලියකරණය, සීඝ්‍රගාමී විද්‍යා සහ තාක්ෂණික

දියුණුව, සංස්කෘතීන් ආකල්පයන් යනාදිය නිරන්තරයෙන්ම වෙනස් වීම යන සිදුවීම් වලින් ගහන දක්නට ලැබෙන විසි එක්වන ශතවර්ෂයේ සමාජයක, ලෝකයක එවැනි තත්ත්වයන්ට අනුගතවන සුපුරුදු ඉංග්‍රීසි වචනය ඉවත්කර නුපුරුදු සිංහල වචනය පුරුදු කර ගැනීමට උත්සහ ගැනීම විරල සිදුවීමකි. නමුත් මින් අදහස් වන්නේ මෙය සිදුවිය නොහැක්කක් වන බව නොවේ. කාලයත් සමග මෙය සිදුවිය හැකි අතර පියවර ගත හැක්කේ ගතවන කාලය අවම කර ගැනීමට යි. මෙවැනි දුර්ලභ සිදුවීමක් සිදුවීමට අත්‍යවශ්‍යම සධකය කාලයයි. කොපමණ කාලයක් ගතවේද යන්න නිශ්චිතවම කිවනොහැකි වුවත් ගතවන කාලය කොපමණ ද එය යම්තාක් දුරට අවම කරගැනීම සඳහා භාෂක සමාජය වශයෙන් අපට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද යන්න මෙම පර්යේෂණයෙන් සොයා බැලිනි.

රජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය යන ආයතන වල දායකත්වයෙන් සම්පාදනය කරන ලද පාර්භාෂික ශබ්ද මාලාවත් සියබස් වෙබ් අඩවියෙන් පල කර ඇති පාරිභාෂික ශබ්ද මාලාවත් සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, විද්‍යා හා තාක්ෂණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය යන ආයතනවල මූලිකත්වයෙන් සම්පාදනය කරන ලද, 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක අ.පො.ස (උ/පෙ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට අදාළ විෂය නිර්දේශයත් මෙම අධ්‍යනයන් සඳහා යොදා ගන්නා ලදි.

සිංහල මාධ්‍යයෙන් සම්පාදිත විෂය නිර්දේශයත්, ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පාදිත විෂය නිර්දේශයත්, දෙස සන්සන්දනාත්මකව බලන විට භාෂා ගැටලුව සහ සම්බන්ධයෙන් දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයක්

නිපුණතාව	නිපුණතා මට්ටම	අන්තර්ගතය	කාලච්ඡේද
	1.4 පරිගණක පද්ධතියක මූලික සංරචක තෝරා වර්ගීකරණය කරයි.	○ ආධාංග, මෘදුකාංග හා ස්ථිරාංග ○ ආධාංග වර්ගීකරණය ○ මෘදුකාංග වර්ගීකරණය ○ හිමිකම් සහිත මෘදුකාංග සහ විවෘත මූලාශ්‍ර මෘදුකාංග	05
	1.5 දත්ත සැකසුම් ජීවන චක්‍රයේ ක්‍රියාකාරකම් විශ්ලේෂණය කරයි.	○ දත්ත එක්රැස් කිරීමේ ක්‍රම ▪ කායික (Manual) ක්‍රම ▪ ස්වයංක්‍රීය ක්‍රම • ප්‍රකාශ සලකුණු කියවනය (OMR), ප්‍රකාශ අනුලක්ෂණ කියවනය (OCR), චුම්බකිත තීන්ත අනුලක්ෂණ කියවනය (MICR), කාඩ්පත්/ පටි/ ලාංජන/ චුම්බකිත තීරු කියවන (Magnetic Stripe Readers) • සංවේදක සහ ලඝුර (Sensors and Loggers) ○ දත්ත වලංගුතා ක්‍රම ▪ වර්ග පරීක්ෂාව (Type Check), ඇතිබව පරීක්ෂාව (Presence Check) , පරාස පරීක්ෂාව (Range Check) ▪ සෝදිසි සංඛ්‍යාංක (Check Digits) භාවිතය ○ දත්ත ආදාන ආකාර ▪ සෘජු ආකාර හා දුරස්ථ ආකාර ▪ මාර්ගගත (Online) සහ මාර්ගගත නොවූ ආකාර ○ දත්ත සත්‍යාපනය (Verification) ○ දත්ත සැකසුම ▪ කාණ්ඩ සැකසුම (Batch Processing) හා තත්කාලීන සැකසුම (Realtime Processing) ○ ආචයනික ක්‍රම (Storage Methods) ○ ප්‍රතිදාන ක්‍රම	05

නම්, සිංහල මාධ්‍යයෙන් සම්පාදිත විෂය නිර්දේශයේ සිංහල පාරිභාෂික වචන යොදාගෙන ඇති නමුත් ඒ සමඟම වරහන් තුළ එම වචනයට අදාළ පාරිභාෂික වචනය භාවිතා කර තිබීමයි. පහත දී ඇති 01 රූපයෙන් දැක්වෙන්නේ සිංහල විෂය නිර්දේශයේ 06 වැනි පිටුව යි.

(රූපය - 01)

සෑම සිංහල පාරිභාෂික වචනයකට ම ඊට අදාළ ඉංග්‍රීසි වචනය ලබා දී ඇති නිසා සිංහල වචනයට වඩා ඉංග්‍රීසි වචනයට සමීප වීමේ සම්භාවිතාව වැඩි වේ. එමනිසා සිංහල වචනය සමාජ ගත වීමේ වේගය මින් බාල වී යයි. සිංහල විෂය නිර්දේශය සිංහල බසින් පමණක් සම්පාදනය කර පාඨකයාට තේරුම් ගැනීමට අපහසු වචන පාරිභාෂික ශබ්ද මාලාවෙන් බලා අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දීමට කටයුතු සැලැස්වීමෙන් විශේෂයෙන් ම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට උගන්වන ගුරුවරුන් අතර සිංහල වචනය සමාජගත වීමේ හැකියාව යම්කිසි අයුරකින් වේගවත් වේ. එසේ ම ඉංග්‍රීසි භාෂාවෙන් සම්පාදිත විෂය නිර්දේශයේ එම අදාළ පිටුව දෙස බැලූ විට සිංහල භාෂාව මිශ්‍ර නොවී සම්පූර්ණයෙන් ම ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් රචනාව පවතී. නමුත් ඉංග්‍රීසි භාෂවෙන් රචිත විෂය නිර්දේශයේ ද සිංහල භාෂාවෙන් රචිත විෂය නිර්දේශය මෙන් පාරිභාෂික වචන යෙදෙන ස්ථානවල වරහන් තුළ සිංහල පාරිභාෂික වචනය යෙදීමෙන්

සිංහල වචන ව්‍යාප්තිය සඳහා යම් පිටුබලයක් ලැබේ. තව ද මෙම පර්යේෂණය සඳහා සිදු කළ ප්‍රශ්නාවලියෙන් හෙළි වූ ආකාරයට සිංහල භාෂාවෙන් මෙම විෂය උගන්වන ගුරුවරුන් 90% ක ප්‍රමාණයක් පාසලේ දී මෙම විෂය ඉගැන්වීමේ දී පාරිභාෂික වචන යෙදෙන අවස්ථාවලදී යොදා ගන්නෙ ඉංග්‍රීසි වචනයි. එමනිසා ගුරුවරුන් අතර සිංහල වචනය සමාජගත කිරීමට නම් සිංහල වචනය හැකිතාක් ඔවුන්ට සමීප කළ යුතු ය. ගුරුවරුන් අතර වචන සමාජගත වීම මඟින් සිසුන් අතර වචන සාමාජගත වීම සඳහා ද පිටුබලයක් ඇති වේ.

ඉහත සඳහන් කළ පරිදි යම් වචනයක් භාෂක සමාජයක් තුළ ස්ථාපනය වන්නේද එම වචනයට අදාළ නිශ්චිත තේරුමක් ස්ථාපනය වන්නේ ද රූඪියක් මඟිනි. එමනිසා අ.පො.ස (සා/පෙ) විභාගයට සහ අ.පො.ස (උ/පෙ) විභාගයන්ට ප්‍රධාන විෂයක් ලෙස සිංහල මාධ්‍යයෙන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය ඇතුලත් කිරීම මෙම විෂයට අදාළ සිංහල වචන සමාජගත කිරීම සඳහා ගතවන කාලය අවම කිරීමට මහත් පිටිවහලක් සපයන බව පසක් වේ. මෙසේ වචන සහ ඒ සමඟම ඒවායේ තේරුම් සමාජගත වීම තොරතුරු තාක්ෂණ විෂයට අදාළ ලේඛන පරිවර්තනය කිරීමට ද සපයන්නේ මහත් රුකුලකි.

10, 11, 12, 13 ශ්‍රේණි වල අධ්‍යාපනය ලබන වයස අවුරුදු 15 සිට 18 දක්වා දරුවන්ගේ මනස තුළට මෙම වචන ඇතුළත් වීමෙන් වැඩිහිටියෙකුගේ මනස උපාර්ජනය කරනවාට වඩා ඉක්මනින් වචන උපාර්ජනය කර ගන්නා අතර වඩා වැඩි කාලයක් මනස තුළ එම වචන රැඳීමද සිදු වේ. එමෙන් ම ඔවුන් සම වයසේ වන මිතුරන්ගෙන් සැදුම්ලත් විශාල භාෂක සමාජයක් සමඟ ගැටෙන නිසාත් වචන ව්‍යාප්තිය සීඝ්‍රගාමී වේ.

මෙම පර්යේෂණයේ දී මෙලෙස පාසල් තුළ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට අදාළ වචන කෙතරම් දුරට සාර්ථකව ව්‍යාප්ත වනවාද යන්න සොයා බැලීම සඳහා ප්‍රශ්නාවලියක් (උපග්‍රන්ථය - 02, පිටු 15 සිට 16) මඟින් කරුණු එක්රැස් කරන ලදි. මෙහි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය උසස් පෙළ විභාගයට ප්‍රධාන විෂයක් ලෙස දැනට රජයේ පාසල්වල උගන්වමින් සිටින ගුරුවරුන් 10 දෙනෙකුගෙන් ප්‍රශ්නාවලියට පිළිතුරු ලබාගත් අතර එම පිළිතුරු විශ්ලේෂණයේ දී විවිධ දුර්වලතා නිසා මෙම ක්‍රියාවලිය පසුගාමී වන

බව මෙම පර්යේෂණය මඟින් අනාවරණය විය. ප්‍රශ්නාවලියේ ප්‍රශ්න අංක 13, 14, 15 යන ප්‍රශ්නවලට ලැබුණු පිළිතුරු සම්පිණ්ඩනය කොට මෙසේ දැක්විය හැකි ය.

13) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට අදාළ විෂය කරුණු සිසුන්ට පැහැදිළි කිරීමේදී

- විෂයට අදාළ පාරිභාෂික සිංහල වචන භාවිත කරයි - 10%
- සිංහල බසින් පැහැදිලි කරන අතරතුර පාරිභාෂික වචන සඳහා ඉංග්‍රිසි වචන භාවිත කරයි - 80%

14) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට අදාළව වාර පරික්ෂණ විභාග ප්‍රශ්නපත්‍ර සකස් කිරීමේදී

- පාරිභාෂික වචන යෙදෙන අවස්ථාවලදී සිංහල පාරිභාෂික වචනය පමණක් භාවිත කරයි - 20%
- පාරිභාෂික වචන යෙදෙන අවස්ථාවලදී ඒ වෙනුවට ඉංග්‍රීසි වචනය භාවිත කරයි - 00%
- පාරිභාෂික වචන යෙදෙන අවස්ථාවලදී සිංහල සහ ඉංග්‍රීසි වචන දෙකම භාවිත කරයි - 80%

16) සිසුන් සිංහල භාෂාවෙන් පිළිතුරු ලියා ඇති අතරවාරයේ සිංහල පාරිභාෂික වචන භාවිත වන අවස්ථාවන්හි දී ඒ සඳහා ඉංග්‍රීසි වචනය නිවැරදිව භාවිත කර තිබේ නම් ලකුණු කැපීමක් සිදු කරයි ද?
ඔව් - 00% නැත - 100% වෙනත් - 00%

ඉහත එක්රැස් කරන ලද දත්ත අනුව පෙනී යන්නේ පාසල් හරහා පාර්භාෂික වචන ව්‍යාප්තවීමේ ක්‍රියාවලිය යම්තාක් දුරට පසුගාමී වන බවයි. මෙම අඩුපාඩු මඟහරවා ගනිමින් හැකි සෑම අවස්ථාවක දී ම සිංහල මාධ්‍යයෙන් උගන්වන ගුරුවරුන්ට සිංහල පාරිභාෂික වචන භාවිතා කිරීමට උපදෙස් ලබාදීම සහ විභාගයේ දී ද සිංහල පාරිභාෂික වචන භාවිතා කිරීම සඳහා සැලකිය යුතු ලකුණක් වෙන් කිරීමට ලකුණුදීමේ නිර්නායකවලට ඇතුලත් කිරීම වැනි ක්‍රියාමාර්ග මඟින් ඉහත දුර්වලතා බොහෝ දුරට වළක්වාගෙන වචන සමාජගත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කළ හැකිය.

තව ද පාරිභාෂික ශබ්ද මාලාවේ සඳහන් වචනවලින් 80% ක් පමණ වචනවල තේරුම් නිරායාසයෙන්ම අවබෝධ නොවන තත්ත්වයේ පැවතීමත් ඒ නිසාම මෙම වචන ලේඛනයක යොදා ගැනීමේ දී එම ලේඛනයට අනුගත නොවන ස්වභාවයක් ගැනීමත් මෙම වචන සමාජගත වීම පසුබෑමට ලක් කරන තවත් ප්‍රබල කරුණකි. ප්‍රශ්නාවලියේ ප්‍රශ්න අංක 11 සහ 12 වෙන් වූයේ මේ සම්බන්ධයෙන් කරුණු විමසා බැලීමටයි.

11) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට අදාළ පාරිභාෂික සිංහල වචනවල තේරුම අවබෝධ කරගැනීමේදී ඔබ අපහසුතාවයට පත්වන අවස්ථා තිබේද?

ඔව් - 100% නැත - 00%

12) අපහසුතාවයට පත් වේ නම් එයට හේතු වශයෙන් ඔබ දකින්නේ මොනවා ද?

- එම වචනවල තේරුම් නිරායාසයෙන්ම අවබෝධ නොවීම - 100%
- එම වචන එදිනෙදා ව්‍යවහාරයේ භාවිත වන වචන නොවීම - 60%

පාරිභාෂික ශබ්ද මාලාවෙන් උපුටා ගත් තේරුම නිතැතින්ම අවබෝධ නොවන පහත සඳහන් පාරිභාෂික වචන දෙස බලන්න.

- Cancel - වැරුම
- Cancel Button - වැරුම් බොත්තම
- Caps lock - මහකුරු යතුර
- Caps lock key - මහකුරු අගුළු යතුර
- Computation - ආගණනය
- Computer awareness - පරිගණකීය දැනුවත් වීම
- Computer simulation - පරිගණකීය විඩම්බනය
- Analog model - ප්‍රතිසම ආදර්ශය
- Animation - සජීවනය
- Auto Dial - නිතැන් අක්වැටුම
- Auto Save - නිතැන් සුරැකුම
- Back space - ආපසු යවනය
- Browse - උඩමතු බලනවා

- Logoff - වරන්න
- Logon - පුරන්න
- Install - පිහිටුවනවා
- Bit - බිටුව
- Logging - ලොගනය
- Mouse Click - මූසික ක්ලිකය

ඉහත උපුටාගෙන ඇති වචනවල ඉංග්‍රීසි වචනය අප සැම කෙනෙකුම ඉතා සමීප සහ ඉතා පහසුවෙන් තේරුම් අවබෝධකර ගත හැකි වචන ය. නමුත් සිංහල වචන යම්කිසි අස්වාභාවික බවක් නොඑසේනම් නුපුරුදු බවක් ගෙන දේ. පහත දී ඇති උදාහරණ දෙස බලන්න.

- Asterix- සූරපප්පා (ඔහු කටයුතුවලට සූර බව වචනයේම පවතී)
- Obelix - පිම්පප්පා (ඔහුගේ අසමාන ශක්තිය, විශාල උදරය අසන්නාට වචනයේම සිහිපත් වේ)
- Cacofonix - කෑ කෝ පප්පා (නිතර කෑ ගසන බවත් ඔහු සොයාගැනීම අපහසු බවත්වචනයේම පවතී)

ඉහත දක්වා ඇති වචනවල තේරුම් නිරායාසයෙන් ම අවබෝධ වීමේ ලක්ෂණය නිසා ඒවා නිරායාසයෙන් ම උපාර්ජනය වේ. නමුත් තාක්ෂණික වචනවලට ආවේණික ලක්ෂණයක් බව දක්නට ලැබෙන කෘතීම සහ තාක්ෂණික ස්වරූපය මතු නොවන ආකාරයෙන් තාක්ෂණික වචන නිර්මාණය කිරීම එතරම් පහසු නොවේ යන්න ද මෙහි දී සිහිපත් කිරීමට කැමැත්තෙමි. නමුත් හැකිතාක් දුරුට මෙම කෘතීම ස්වරූමය අවම කරමින් ස්වභාවික භාෂාවට සමීප වන ආකාරයට පාරිභාෂික වචන නිෂ්පාදනය කිරීම වචන ව්‍යාප්ත කිරීමේ ගැටලුවට යම්කිසි සහනයක් සැලසීමට උපකාරීවන බව මාගේ අදහසයි.

පාරිභාෂික ශබ්ද මාලාව විශ්ලේෂණය කිරීමේ දී සමහර වචන ශබ්ද ප්‍රතිලේඛනය කරමින් පරිවර්තනය කර තිබීමේ ලක්ෂණය ද දක්නට ලැබුණි. පෙර සඳහන් කළ පරිදි සිංහල පාරිභාෂික වචනයට වඩා ඉංග්‍රීසි වචනය සමාජයට හුරු නිසා එම ඉංග්‍රීසි වචන වල ශබ්දයට අනුරූප සිංහලට අකුරු ආදේශ කරමින් එම වචනයේ ශබ්දය සිංහල භාෂාවෙන් ප්‍රතිලේඛනය කර යොදා ගැනීම පහසුවෙන් එම වචන සමාජගත කළ හැකි ක්‍රමයකි.

ශබ්ද ප්‍රතිලේඛනය කරමින් නිර්මාණය කළ සිංහල වචනවලට උදාහරණ කිහිපයක්

- Assembly language - එසම්බ්ලි භාෂාව
- Alt key - ඇල්ට් යතුර
- Cursor - කර්සරය
- Adaptor - ඇඩැප්ටරය
- Bit locker - බිට් ලොකර්
- Dial - ඩයල් කරන්න
- Directory - ඩිරෙක්ටරිය
- Java Script - ජාවා ස්ක්‍රිප්ට්
- Spy net - ස්පයි නෙට්

මෙම වචන සමාජගත කිරීම පහසු වුවත් යම් විෂයකට අදාළ පාරිභාෂික වචනයක් නිර්මාණය කිරීමේ දී එම භාෂාවේ අනන්‍යතාවය සුරැකෙන පරිදි සිදු කළ යුතුය. එමනිසා සෑම සිංහල පාරිභාෂික වචනයක්ම ශබ්ද ප්‍රතිලේඛනය කිරීමේ ක්‍රමවේදයට අනුව නිර්මාණය කළ හැකි ය. මෙම ගැටලුව විසඳුම් ලෙස ඉහත සඳහන් කර ඇති විවිධ විසඳුම්වලට අමතරව, පෙන්වා දී ඇති ගැටලු හැකිතාක් මගහරවා ගැනීම මඟින් වචන ව්‍යාප්තිය සිසුගාමී කළ හැකි අතර පාසල හරහා වචන ව්‍යාප්ත කිරීමට වැඩි අවධානය යොමු කිරීම ද කළ හැකි ය. සමාජ සන්නිවේදන ජාල (Google, Facebook, Twitter, E-mail, Viber etc) යනාදිය ද සිංහලෙන් භාවිත කරීමට උනන්දු කරවීම තවත් විසඳුමක් ලෙස දැක්විය හැකි ය.

ආශ්‍රිත ග්‍රන්ථ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය නිර්දේශය, සිංහල මාධ්‍යය - http://www.nie.sch.lk/ebook/s12syl33.pdf

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය නිර්දේශය, ඉංග්‍රීසි මාධ්‍යය - http://www.nie.sch.lk/ebook/s12syl33.pdf
- ජාතික අධ්‍යාපන ආයතනය

- http://www.nie.lk/pages/syllabus.asp
- ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය - http://www.icta.lk/index.php?lang=si
- නැණසල - http://www.nenasala.lk/
- භාෂා තාක්ෂණ පර්යේෂණාගාරය, කොළඹ විශ්වවිද්‍යාලය
- http://www.ucsc.cmb.ac.lk/ltrl/ , http://www.ucsc.cmb.ac.lk/ltrl/?lang=si&page=home&style=default –
- සිංහල යුනිකෝඩ සමූහය
- https:// groups.google.com/forum/#!topic/sinhala- unicode/Kt_PEmyC9ag

උප ග්‍රන්ථය - 01

සිංහල යුනිකෝඩ සමූහයේ සමාජිකයන් අතර 2013.06.07 දින විද්‍යුත් තැපැල හරහා සිදු වූ සාකච්ඡාවකින් උපුටා ගන්නා ලද කොටසක් (සිංහල යුනිකෝඩ සමූහය https://groups.google.com/forum/#!topic/sinhala-unicode/Kt_PEmyC9ag)

[සිංහල යුනිකෝඩ සමූහයට සාමාජිකයන් වශයෙන් බැඳී සිටින බොහෝ දෙනා විදේශ රටවල සහ ලංකාවේ පරිගණක මෘදුකාංග ශිල්පීන්, පරිගණක වැඩසටහන් නිර්මාණකරුවන්, ග්‍රැෆික් නිර්මාණකරුවන් යනා දී තොරතුරු තාක්ෂණ විෂය මූලික කරගත් වෘත්තීන්වල නිරත වන අයයි. මොවුන් බොහෝ විට යුනිකෝඩ සමූහයේ සාමාජිකයන් සමඟ සංවාදයේ යෙදෙන්නේ යුනිකෝඩ භාවිතා කරමින් සිංහල භාෂාවෙන් වන අතර තොරතුරු තාක්ෂණ විෂයේ දක්නට ලැබෙන තාක්ෂණික වචනවලට සිංහල වචන සෙවීමත් මොවුන් නිරන්තරයෙන් ම සංවාදයේ යෙදීමට ගැටලුවක් බවට පත්වන ක්ෂේත්‍රයකි.

-පර්යේෂක-]

2013/6/7 විශ්ව කුමාර <vishva...@gmail.com>

මෙහෙම කිවුවට මතයක් නෙවෙයි මට හිතෙන දේ ..
කවුරුත් මුකුත් හිතන්නෙපා .. ඇත්තටම
සිංහල වචන විකාරයි කියවගන්නත් .සමහර ඉංග්‍රීහසි වචන වලට දාන .. බැහැ
මතක හිටින ප්‍ර ශ්නේ නං මගේ එකක් .. අනික් කාරනාව මතක හිටින්නෙත් නැහැ ..
සමහර විට.. එත් සිංහල වචනේ විකාරයි .. වෙන්න ඇතිඅපි අදහස් කරන දේ ඒ
වචනෙන් එන්නේ නැහැ මම.. මට මතක නැහැ ..IT කරන්නේ මට ඕනි තරන් ඒ ..
ජයෙන් ජය මේ කරන යන ..හරි හරි .. හෙහ් හේ .. වගේ වචන හම්බු වෙලා තියෙනවා
...වැඩේටසුදුමහත්තයා ගේ කතාවත් ඇත්ත,

සිහිති රුව ක්ලික් කරන්න කියුවොත් විකාර වගේ නේද?

Best Regards,

Vishwa Ranganath විශ්ව රංගනාත්

+94 077 2078816

vish...@gmail.com

www.BoomPeek.com

Best Online Place Buy And Sell Vehi

ඕක ගැන මාත් කලින් කොහේ හරි අදහසක් කියලා තියනවාදවසක් එක ! link කියන වචනෙට කියන සිංහල වඩනේ දන්නෙ නැතුව කව්දෝ කෙනෙක් ඒක !තිබ්බා දාලා කියලා "කරන්න ක්ලික් ලිඟුව පහත" දෙයක් හොඳ වෙන්න හිනා උනත් දෙයක් යන හිනා වගේ විහිලුවත් න දන්නෙ වචනය සිංහල ගැලපෙන හැමදේටම !නෙමෙයිඇත්තං හෝ භාවිතා කරන්න අපහසු (අවස්ථාවකදී වැනි කියවීමේදී නගා හඩ) !නෑ දකින්නෙ වරදක් ඒකෙ නං මං කිව්වට වදනඉංග්‍රීමසි වෙලාවකට ගැනීමෙ තේරුන් ඒක කෙනාට ඉන්න අහන් එතකොට විට සමහර !වැඩියි හැකියාවත්

උදාහරණයක් විදියට වඩා කියනවට "එන්න ගෙන මුලට සැරිත්ත" කර්සරය ලේසියි (cursor) මුලට ගෙන එන්න කියන එකවගේම ඒ ! !පහසුයි ගන්නත් තේරුන් කෙනෙක්ට දන්න ඒක

අනික පරිසණක ආශ්‍රිඩකිදන් වලින් ගොඩක් සිංහලයට පරිවර්තනය කරාම හමුවන සිංහල වදන් ඇත්තෙන්ම හුඟක් වෙලාවට හරි අපහසුයි උච්චාරණය කිරීමට!

නිරංජන්

වචන හදන්න මනස කලම්බන්න ඕනේ.

ඒක තනිවම බෑ.විශ්ව දූන්නා වගේ පළමුව අදහස විස්තර කරන එක හොඳයි .

කාලයක් යනකොට සන්දි ආදිය කරලා ලස්සන මටසිලුටු වචනයයක් එනවා.

මුද්රා පිංතූරුයිංතූර මුද්රාුව නිරංජන්

Maduka Jayalath

මටත් පොඩි දෙයක් කියන්න හිතුනා , ඇයි මේ හැමෝම ඉංග්රිංසි වචනයේ අර්ථය සිංහලෙන් නිරූපණය කිරීමට උත්සහා කරන්නේ? මේක වචන නිර්මාණයක් නෙමෙයි, වචන පරිවර්තනයක් නේ!

නිකමට හිතන්න Road(A wide way leading from one place to another, esp. one that vehicles can use.) කියන වචනයට කියලා වචනයක් හදන්නේ "පාර" නැතුව ඕක ඉංග්රීසියෙන් සිංහලට පරිවර්තනය කළා නම් එන්නේ වචනයක් වෙනුවට ජේදයක්.

"තඹුරුව කියන වචනය වෙන මොකටද භාවිතා වෙන්නේ "? සමාන වචන තිබීම භාෂාවක ලක්ෂණයක් නේද?

2013/6/10 නිරංජන් <uni...@info.lk>

- show quoted text -**CN**

"තඹුරුව"

මමත් කැමතියි මේකට නම් !

සුදු මහත්තයාගේ කථාවත් ඇත්ත...

වැඩේ කරගෙන යනකොට මතුවෙන අඩුපාඩු හදාගන්න පුළුවන් වේවි ... !!!! ජය

2013/6/10 Maduka Jayalath <madu...@gmail.com>

- show quoted text -

Chathuranga Perera | චතුරංග පෙරේරා
Senior Graphic Designer / Writer,
Roo Pariganaka ICT magazine,
SoftImage Publications.
Pannipitiya, Sri Lanka
http://chathucn.blogspot.com/

නිරංජන් ෴

ගුගල් සෙවූ විට
තඹුරු කියන්නේ මල් වලට
බිම් තඹුරු මල්
තඹරුව කියානම් නෑ!
පැටලෙයිද?
C.J

Car යන්නට කාර ය , Lorry යන්නට ලොරි ය , වගේ Thumb යන්නට තඹ ය , ලෙස සලකා තඹ රුව සදා ඇති බව+ පෙනෙයි. වචන දෙකම සිංහලයෙන් සඳන්නට ඕන නම් 'තඹ' යන්න වෙනුවට Nail යන්නෙහි සිංහල අරුත එන පරිදි නියපොත්ත යන වචනයේ නිය කොටස ගෙන නිය ලෙස ගන්නට (නියරුව) රුව+ පුළුවනි නේද.

Nail + Image = නියරුව නැතිනම්
Thumb +Nail +Image ලෙසම ගෙන තඹ .රුව ලෙස ගන්නට පුළුවන් නේද+ නිය+
2013/6/15 නිරංජන් ෴ <uni...@info.lk>
- show quoted text -

HelaSen

මම කැමති **"Thumbnail Image"** කියන එකට ගැළපෙන්නේ නියැදි සේයාව වගේ වචනයක් මම හිතනවා නියම අරුත එහි තියනවා කියලා
2013/6/15 Janaka Premachandra <jana...@gmail.com>

- show quoted text -

Thank You

Narada Opanayake

Mobile : 077 22 87 488 / 071 22 70 766

Email : hel...@gmail.com / in...@helasen.com

GayanKu

Thumbnail කියන්නේ මොකක්ද දන්නවද ? **Thumbnails** are reduced-size versions of pictures, used to help in recognizing and organizing them, serving the same role for images as a normal text index does for words. එතකොට IMAGE කියන්නේ රූපයඑහෙනම් එතකොට . **Thumbnail** IMAGE කියන්නේ යම්කිසි රූපයක් හදුනාගනීමට බාවිතා කරන එකේම කුඩා රූපයක්. අපි ඇදුරුම් කම් කියල කියන්නේ යමෙක් හදුනාගත් පසු ඇතිවන සම්බන්දතාවයට එසේන .ම Thumbnail IMAGE හෙවත් යමක් හදුනාගැනීමට යොදාගන්නා කුඩා රූපයට වඩාත්ම ගැලපෙන වචනය ඇදුරුම් සේයාව නේද?

Thumbnail IMAGE = ඇදුරුම් සේයාව

2013/6/17 vishwa ranganath <vish...@gmail.com>

- show quoted text -

මීට බොහෝකලකට පෙර Icon යන්නට නම් යන වචනය මම යෝජනා "කුරූපිකය"
.කලා
එය දැනට කවුරුන් විසින් හෝ එය භාවිතා කරනවාද යන්න නම් දන්නේ නැහැ .
Thumbnail යන්නට යන්න තමයි සිංහල ශබ්දකෝෂයේ නම් සඤ්ඥාද් ද්‍ර රූපය"
.වෙන්නේ
පොඩ්ඩක් හොයලා බලන්න.
-යූ.ඩී .

On Friday, June 7, 2013 12:35:05 PM UTC+2, විශ්ව කුමාර wrote:

ෂෙහාන් තුෂාර හේමාල්

සිගිති රුව , මුද්‍රාම පිංතූරය පිංතූර මුද්‍රාරව , තඹුරුව, නියැදි සේයාව , තම්බ්නේල් ආදී වචන Thumbnail Image යන්නට නොගැලපෙන ගතියක් මට දැනෙනවා , එම)Thumbnail Image) වචනයේ අර්ථය

ගැනත් හිතන විට "හැඳුනුම් සේයාව" හෝ "හැඳුනුම් රූ" යනුවෙන් භාවිත කිරීම වඩාත් උචිත බවයි මගේ අදහස.

උපග්‍රන්ථය - 02

තොරතුරු තාක්ෂණ විෂයට ආවේණික ඉංග්‍රීසි වචන (Computer Jargon) සිංහල භාෂාවට හැරවීම සහ ...

01 නම : --

02 උගන්වන පාසල : --

03 උගන්වන විෂයන් : --

04 උගන්වන ශ්‍රේණිය : --

05 උගන්වන මාධ්‍යය : --

06 තොරතුරු තාක්ෂණ විෂය කොපමණ කාලයක් තිස්සේ උගන්වමින් සිටී ද? : ----------------------

07 තොරතුරු තාක්ෂණ විෂය සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීමේදී සිංහල විෂය නිර්දේශයට අමතරව ඉංග්‍රීසි විෂය නිර්දේශයද භාවිත කරන අවස්ථා තිබේ ද? -- ----------------------

08 ඒ කුමන අවස්ථාවලදී ද? :

09 වචනවල තේරුම් අවබෝධකර ගැනීම සඳහා

10 අදාල පරිච්ඡේදයේ හෝ වාක්‍යයේ තේරුම අවබෝධකර ගැනීම සඳහා

වෙනත්: --

----

11 තොරතුරු තාක්ෂණ විෂයට අදාළ පාරිභාෂික සිංහල වචනවල තේරුම අවබෝධ කරගැනීමේදී ඔබ අපහසු...

ඔව් නැත

12 අපහසුතාවයට පත් වේ නම් එයට හේතු වශයෙන් ඔබ දකින්නේ මොනවා ද?

එම වචනවල තේරුම් නිරායාසයෙන්ම අවබෝධ නොවීම

එම වචන එදිනෙදා ව්‍යවහාරයේ භාවිත වන වචන නොවීම

වෙනත් : --

13 තොරතුරුතාක්ෂණ විෂයට අදාළ විෂය කරුණු සිසුන්ට පැහැදිලි කිරීමේ දී

එම විෂයට අදාළ පාරිභාෂික සිංහල වචන භාවිත කරයි

සිංහල බසින් පැහැදිලි කරන අතරතුර පාරිභාෂික වචන සඳහා ඉංග්‍රිසි වචන භාවිත කරයි

වෙනත් : ---

----

14 පාරිභාෂික සිංහල වචන භාවිත කරයිනම් එම අවස්ථාවලදී සිසුන් අපහසුතාවයකින් තොරව එම වචනවල තේරුම අවබෝධ කර ගනීද?

ඔව් | | නැත

15 තොරතුරුතාක්ෂණ විෂයට අදාළව වාර පරික්ෂණ විභාග ප්‍රශ්නපත්‍ර සකස් කිරීමේ දී

පාරිභාෂික වචන යෙදෙන අවස්ථාවලදී සිංහල පාරිභාෂික වචනය පමණක් භාවිත කරයි

පාරිභාෂික වචන යෙදෙන අවස්ථාවලදී ඒ වෙනුවට ඉංග්‍රීසි වචනය භාවිත කරයි

පාරිභාෂික වචන යෙදෙන අවස්ථාවලදී සිංහල සහ ඉංග්‍රීසි වචන දෙකම භාවිත කරයි

වෙනත්: ---
----

16 පිළිතුරුපත් ඇගයීමේ දී සිසුන් සිංහල භාෂාවෙන් පිළිතුරු ලියා ඇති අතරවාරයේ සිංහල පාරිභාෂික වචන භාවිතා වන අවස්ථාවන්හී දී ඒ සඳහා ඉංග්‍රීසි වචන නිවැරදිව භාවිත කර තිබේ නම් ලකුණු කැපීමක් සිදු කරයි ද?

ඔව් | | නැත

----

16 i එසේ ලකුණු කැපීමක් සිදු කරයි නම් එයට හේතුව කුමක් ද? ---
----

16 ii ලකුණු කැපීමක් සිදු නොකරයි නම් එයට හේතුව කුමක් ද? ---